JMC vLearning
"your virtual learning partner"

# ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා මූල්‍ය ප්‍රකාශන

## AAT අදියර II
## AFC - උසස් මූල්‍ය ගිණුම්කරණය හා පිරිවැයකරණය

අමිල සම්පත්
B.Sc. (Finance) USJ (UG), CASL (Finalist), AAT Passed Finalist (Prize Winner)

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917




# ලාභ අරමුණුකර නොගත් ව්‍යාපාර සඳහා ගිණුම්කරණය

JMC Learning
your virtual learning partner

# ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සඳහා උදාහරණ

- ක්‍රීඩා සමිති
- සමාජය ශාලා
- ආගමික සංවිධාන
- මරණාධාර සමිති
- වෘත්තීය සමිති
- ආදි ශිෂ්‍ය සංගම්
- කාන්තා සමිති



JMC vLearning
"your virtual learning partner

# ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සහ ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර අතර වෙනස්කම්

| | ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර | ලාභ අරමුණු කරගත් ව්‍යාපාර |
|---|---|---|
| අරමුණ | සමාජ සුබසාධනය සහ යහපැවැත්ම | ලාභ උපරිම කිරීම |
| අරමුදල් සම්පාදනය කර ගන්නා ආකාරය | සාමාජික මුදල් සහ අනෙකුත් අරමුදල් සම්පාදන ක්‍රියාකාරකම් මගින් | අයිතිකරුවන් විසින් ප්‍රාග්ධනය සපයයි |
| මූල්‍ය ප්‍රතිඵලය | අතිරික්තය හෝ ඌනතාවය ලෙස හඳුන්වයි | ලාභය හෝ අලාභය ලෙස හඳුන්වයි |

JMC Learning your virtual learning partner

# ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සහ ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර අතර වෙනස්කම්

| | ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර | ලාභ අරමුණු කරගත් ව්‍යාපාර |
|---|---|---|
| පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන | ආදායම් වියදම් ගිණුම<br>මූල්‍ය තත්ව ප්‍රකාශය | ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය<br>මූල්‍ය තත්ව ප්‍රකාශය |
| අතිරික්තය | කිසිම විටක සාමාජිකයන් අතර නොබෙදේ | ව්‍යාපාරය වර්ධනයට ආයෝජනය හෝ අයිතිකරුවන් අතර බෙදා හරී |

# මෙවැනි වූ ව්‍යාපාර ගිණුම්කරණය සිදු කිරීමට හේතු

- බාධාවක් අවහිරයක් නොමැතිව පවත්වාගෙන යෑම සඳහා
- වර්තමාන මූල්‍ය තත්ත්වය හා කාර්ය සාධනය සාමාජිකයන්ට දැනගැනීමට
- ආයතනයේ පරිපාලකයින්ගේ සහ කළමනාකරුවන්ගෙන් කාර්ය සාධනය මැනීමට
- අනාගත සැලසුම් සකස් කිරීම සඳහා
- ඇතැම් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා

# ව්‍යාපාර පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන සැසඳීම

| අරමුණ | ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර | ලාභ අරමුණු කරගත් ව්‍යාපාර |
|---|---|---|
| මුදල් ලැබීම් හා ගෙවීම් වාර්ථා කිරීමට | ලැබීම් හා ගෙවීම් ගිණුම | මුදල් පාලන ගිණුම |
| කාර්ය සාධනය ගණනය කිරීමට | ආදායම් වියදම් ගිණුම | ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය |
| මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කිරීමට | තත්තව විස්තරය (මූල්‍ය තත්ව ප්‍රකාශය) | මූල්‍ය තත්ව ප්‍රකාශය |

# ලැබීම් හා ගෙවීම් ගිණුම

- යම් නිශ්චිත කාල පරිච්ඡේදයක මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම් වල සාරාංශය පෙන්වන ගිණුම මින් අදහස් වේ. මෙය ලාභ ලබන ආයතනයක මුදල් පාලන ගිණුමට සමාන වේ

- ඒ අනුව මෙහි ගනුදෙනු සටහන් කිරීමේදී වත්කම් ගිණුමක රීතිය භාවිතා කරන අතර මුදල් ලැබීම් හරට ද මුදල් ගෙවීම් බැරටද සටහන් කරනු ලබයි

- මෙමගින් කාලච්ඡේදය අවසානයේ ඇති මුදල් ශේෂය ගණනය කර ගනු ලබයි

# උදාහරණය 01

ජීවක මරණාධාර සමිතිය ලැබීම් හා ගෙවීම් ගිණුමට අදාලව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 2019 ජනවාරි 1 දිනට මුදල් ශේෂය | 35,000 | වැටුප් හා වේතන ගෙවීම | 24,000 |
| සාමාජික මුදල් ලැබීම් | 250,000 | ලද පොලී ආදායම | 16,000 |
| නව සාමාජික ඇතුලත්වීමේ ගාස්තු | 40,000 | පුටු මිලදී ගැනීම | 60,000 |
| පරිත්‍යාග වශයෙන් ලද මුදල් | 30,000 | තහඩු මිලදී ගැනීම් | 80,000 |
| ගොඩනැගිලි කුලිය ගෙවීම | 48,000 | මුද්‍රණ වියදම | 8,000 |
| විදුලි වියදම් ගෙවීම් | 12,000 | ප්‍රචාරණ වියදම් | 3,000 |
| වරිපනම් ගෙවීම | 2,000 | | |

JMC vLearning
"your virtual learning partner"

# ආදායම් හා වියදම් ගිණුම / ආදායම් ප්‍රකාශය

- ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ගිණුම් කාලච්ඡේදයක කාර්යසාධනය හෙවත් මූල්‍ය ප්‍රතිඵලය නිශ්චය කිරීමට සකස් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයයි.

- මෙහිදී උපචිත පදනම අනුව ආදායම් සහ වියදම් සංසන්දනය කොට අතිරික්තයක් හෝ ඌනතාවයක් හඳුනාගෙන පසුව එය සමුච්චිත අරමුදලට මාරු කිරීමක් සිදුවේ.

- මෙය උපචිත පදනම අනුව පිළියෙල කරයි

# ආදායම් වියදම් ගිණුම සහ ලැබීම් ගෙවීම් ගිණුම අතර වෙනස්කම්

| ලැබීම් ගෙවීම් ගිණුම | ආදායම් වියදම් ගිණුම |
|---|---|
| මුදල් පදනම මත පිළියෙල කරයි | උපචිත පදනම මත පිළියෙල කරයි |
| අවසාන ප්‍රතිඵලය මුදල් ශේෂය වේ. | අවසාන ප්‍රතිඵලය අතිරික්තය ඌනතාවය ලෙස හඳුනාගෙන සමුච්ත අරමුදලට මාරු කරයි |
| ප්‍රාග්ධන මෙන්ම අයභාර මුදල් ලැබීම් හා ගෙවීම් ඇතුළත් කරයි | අයභාර ආදායම් සහ වියදම් පමණක් ඇතුළත් කරනු ලබයි |
| මුදල් ගනුදෙනු පමණක් ඇතුළත් වේ | ක්ෂය වීම් වැනි මුදල් ගලා නොයන අයිතම ද ඇතුළත් වේ |

JMCvLearning "your virtual learning partner"

# ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක සාමාන්‍යයෙන් පැවතිය හැකි ආදායම් සහ වියදම්

| ආදායම් | වියදම් |
| --- | --- |
| • සාමාජික මුදල්<br>• ඇතුලත්වීමේ ගාස්තු<br>• පරිත්‍යාග ලැබීම්<br>• පොලී වැනි ආදායම් ලැබීම්<br>• අරමුදල් වර්ධන ක්‍රියා ක්‍රියාකාරකම් තුළින් ලැබීම්<br>• වෙනත් වෙළඳ කටයුතු වලින් උපයන ලාභ | • රැස්වීම් වියදම්<br>• ක්ෂය වීම්<br>• බැංකු ගාස්තු<br>• වැටුප්<br>• විදුලිය<br>• උත්සව වියදම් |

JMC vLearning "your virtual learning partner"

………………….සමිතිය

…………………..දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් හා වියදම් ගිණුම


| | | රු |
|---|---|---|
| ආදායම් | | XXX |
| (-) වියදම් | | (XXX) |
| අතිරික්තය හෝ ඌනතාවය | | XXX |

JMC vLearning
"your virtual learning partner"

# සමුච්චිත අරමුදල

- ලාභ අරමුණු කරගත් වී ව්‍යාපාරයන්හි මෙන්ම ලාභ අරමුණුකර නොගත් සංවිධාන වලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ඒවායේ වත්කම් සහ වගකීම් ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කරනු ලබයි
- ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයන්හි ප්‍රාග්ධනය ගණනය කළ ආකාරයටම මෙහි දී සමුච්චිත අරමුදල ගණනය කරනු ලබයි.

JMC vLearning "your virtual learning partner"



# සාමාජීක මුදල් සඳහා ගිණුම්කරණය

# සාමාජික මුදල්

- ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක සාමාජිකයන් තම සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා නිශ්චිත කාලයකට වරක් සාමාජික ගාස්තු ගෙවයි
- සාමාජික ගාස්තු, ලාභ නොලබන ආයතන වල ප්‍රධානම ආදායම් මාර්ගය ලෙස සැලකේ
- මෙම සාමාජික ගාස්තු ලෙස සාමාජිකයන්ගෙන් මාසිකව, තුන්මාසිකව හෝ වාර්ෂිකව යම් නිශ්චිත මුදලක් අය කරයි

JMC vLearning "your virtual learning partner"

# සාමාජික මුදල්

- මෙම සාමාජික ගාස්තු අය කරන ආකාරය අනුව ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැක
  - වාර්ෂික සාමාජික මුදල්
  - යාවජීව සාමාජික මුදල්

JMC vLearning "your virtual learning partner"

# වාර්ෂික සාමාජික මුදල්

- වාර්ෂික සාමාජික මුදල් ලෙස සාමාජිකයන්ගෙන් සෑම වර්ෂයකදීම මාසිකව, තුන්මාසිකව හෝ වාර්ෂිකව යම් මුදලක් අයකර ගැනීම මෙහිදී සිදු වේ

- වාර්ෂික සාමාජික මුදල් ආදායම ගණනය කර ගැනීම සඳහා අප සාමාජික මුදල් ගිණුම නම් ගිණුමක් පිළියෙල කරනු ලබයි.

JMC vLearning
"your virtual learning partner"

# යාවජීව සාමාජික මුදල්

- ඇතැම් සාමාජිකයන් තම දායක මුදල් සියල්ල එකවර ගෙවා මුළු ජීවිත කාලයටම සාමාජිකත්වය ලබා ගැනීම යාවජීව සාමාජිකත්වය වේ.

- එලෙස යාවජීව සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සාමාජිකයන් ගෙවන මුදල් යාවජීව සාමාජික මුදල් ලෙස හඳුනා ගනී.

- ඒවා යාවජීව සාමාජික අරමුදල් නම් විශේෂිත ගිණුමක සටහන් කොට වාර්ෂිකව යම් නිශ්චිත වටිනාකමක් ආදායම් වියදම් ගිණුමට හඳුනාගනී


JMC vLearning "your virtual learning partner"

# යාවජීව සාමාජික මුදල්

- යාවජීව සාමාජික මුදල් ලැබෙන විට
  - ලැබීම් හා ගෙවීම් ගිණුම — හර
  - යාවජීව සාමාජික අරමුදල් ගිණුම — බැර

- කාලච්ඡේදයේ ආදායම ලෙස හඳුනාගන්නා ප්‍රමාණය
  - යාවජීව සාමාජික අරමුදල් ගිණුම — හර
  - ආදායම් වියදම් ගිණුම — බැර

JMC vLearning
"your virtual learning partner"



# පරිත්‍යාග සඳහා ගිණුම්කරණය

JMC Learning "your virtual learning partner"

# පරිත්‍යාග සඳහා ගිණුම් තැබීම

- ලාභ නොලබන ආයතන සඳහා පරිත්‍යාග වශයෙන් මුදල් සහ භාණ්ඩ ලැබේ
- මෙලෙස මුදලින් ලැබෙන පරිත්‍යාග යම්කිසි නිශ්චිත අරමුණක් සඳහා ලැබුණ හෝ පොදුවේ ලැබෙන පරිත්‍යාග ලෙස වර්ග දෙකකට බෙදා වෙන්කළ හැකිය

# පරිත්‍යාග සඳහා ගිණුම් තැබීම

- විශේෂිත මුදල් පරිත්‍යාග
  - ලැබීම් හා ගෙවීම් ගිණුම — හර
  - අදාළ අරමුදල් ගිණුම — බැර
- සාමාන්‍ය/පොදු මුදල් පරිත්‍යාග
  - ලැබීම් හා ගෙවීම් ගිණුම — හර
  - ආදායම් වියදම් ගිණුම — බැර
- ද්‍රව්‍ය වශයෙන් ලැබෙන පරිත්‍යාග
  - අදාළ වත්කම් ගිණුම — හර
  - ආදායම් වියදම් ගිණුම — බැර




# යම් වෙළඳ කටයුත්තක් පවත්වාගෙනයාම සඳහා ගිණුම්කරණය

- ලාභ නොලබන ආයතන අමතර ආදායම් ලැබීමේ පරමාර්ථයෙන් ඇතැම් වෙළඳ ව්‍යාපාර කටයුතු පවත්වාගෙනගෙන යයි

- උදාහරණ ලෙස
  - අදාල ගොඩනැගිල්ලේ කොටසක ආපනශාලාවක්, බීමහලක් පුස්තකාලයක් ආදිය පවත්වාගෙන යාම
  - ටිකට්පත් දිනුම් ඇදීම
  - තම ගොඩනැගිල්ලේ කොටසක් කුළියට දීම
  - විවිධ සංගීත සංදර්ශන, සැනකෙලි ආදිය පැවැත්වීම

- මෙසේ පවත්වන ව්‍යාපාර සඳහා සාමාන්‍ය ලාභ ලබන ව්‍යාපාරයක ගිනුම් තබන පරිදි ගිණුම් තැබිය යුතු අතර වෙන වෙනම ලාභය අලාභය ගණනය කළ යුතු වේ

- එලෙස ගණනය කරන ලාභය හෝ අලාභය ලාභ නොලබන ආයතනයේ ආදායම් හා වියදම් ගිණුමට රැගෙන යා යුතුය

- ලාභයක් නම් ආදායමක් ලෙස ද අලාභයක්නම් වියදමක් ලෙසද ආදායම් වියදම් ගිණුම තුළ හඳුනාගත යුතුය.